ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විද්‍යාවේදී /අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව

3 වන මට්ටම- 2008/2009

ඇගැයීමේ පරීක්ෂණය I - විවෘත පොත් පරීක්ෂණය

BTU 1201/BTE 3201 - ශාක විවිධත්වය

කාලය - පැය 1 යි.

ලියාපදිංචි අංකය -------------------------

---

දිනය- 2009.01.31 වේලාව - ප.ව. 01.30 - ප.ව. 02.30 දක්වා

---

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයෙහිම ලියන්න.
ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තුනක් (03) හා පිටු හතරක් (04) ඇත.

01. පහත සඳහන් වගන්ති වල සත්‍ය මෙන්ම අසත්‍ය වගන්ති ද ඇතුළත් වේ. එක් එක් වගන්තිය ඉදිරියෙන් දී ඇති තිත් ඉර මත 'ස' අකුර ලිවීමෙන් සත්‍ය වගන්තිත් 'අ' අකුර ලිවීමෙන් අසත්‍ය වගන්තිත් දක්වන්න.

i. සයනොබැක්ටීරියාවන්ගේ වායු රික්තක තාන ජ්ලාස්ටයෙන් වටවූ සත්‍ය රික්තක නොවේ. (--------------)

ii. වෛරස ප්‍රතිවලිත වීමේ චක්‍රයෙහි අවසාන අවධිය වනුයේ වෛරස සංඝටක එක් රැස් වීමයි. (--------------)

iii. මේ වනතෙක් ටිකොයික් අම්ලය සොයාගෙන ඇත්තේ ග්‍රෑම් සෘණ බැක්ටීරියාවන්ගේ පමණි. (--------------)

iv. මුලාංග බොහොමයක් හමුවන්නේ බැසිඩියොමයිසීටීස් සාමාජිකයන්ගේ ය. (--------------)

v. දිලීර සූත්‍රිකා, දිලීරවල වර්ධක අවධියෙහි කොටස් නොවේ. (--------------)

vi. විටෙකර් (Whittaker) විසින් 1969 දී ද්විපද නාමකරණ ක්‍රමය ඉදිරිපත් කරන ලදී.(--------------)

vii. සෙෆලොස්පෝරින් (Cephalosporin) ප්‍රතිජීවකය, බැක්ටීරියා සෛල බිත්තිවල පෙප්ටිඩොග්ලයිකැන් සංස්ලේෂණය අවහිර කරයි. (--------------)

viii. ජ්ලස්මයෝගය, න්‍යෂ්ඨියෝගය සහ අනුනනය දිලීරවල ලිංගික ප්‍රජනනයෙහි අවධි තුන වේ. (----------)

ix. *Cystopus* ගදා හැඩැති බීජාණුධානි ධර හා කොණිඩි බීජාණුදාම නිපදවයි. (------------)

x. *Absidia,* ධාවකය දිගේ මුලාභවලට ප්‍රතිවිරුද්ධව, කාණ්ඩ වශයෙන් බීජාණුධර නිපදවයි. (--------------)

xi. අස්කොමයිකොටයිනාවන්ගේ ලිංගික බීජාණු අස්ක බීජාණු වේ. (--------------)

xii. මික්සොමයිකෝටාවන්ගේ වර්ධක දේහය ප්‍රාක් ජ්ලාස්ම ස්කන්ධයකි. (------------)

xiii. ටර්නිප් කහ විචිත්‍ර වෛරසය විංසතිතලීය සමමිතියක් පෙන්වයි. (------------)

xiv. ඇස්කොමයිසීටීස් සාමාජිකයන් සියල්ලන්ගේ අස්කස දැකිය හැක්කේ නියමිත බීජාණුකරයක් තුලය.(--------------)

xv. පික්නිඩියා යනු, දිලීර නිපදවන අලිංගික බීජාණුකර වර්ගයකි. (--------------)

xvi. සයනොබැක්ටීරියාවන්ගේ ප්‍රභාසංස්ලේෂක වර්ණක හොඳින් සංවිධානය වූ හරිතලව තුල අඩංගු වී ඇත. (--------------)

xvii. *Helminthosporium,* ශාක පරපෝෂී දිලීරයක් වන අතර ඉදුණු පළතුරුවල කුණුවීම සිදු කරයි. (--------------)

xviii. *Voiveriella* යනු ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන ආහාරයට ගත හැකි දිලීරයකි. (--------------)

xix. *Saccharomyces ludwigii* හි සාමාන්‍ය වර්ධක සෛල ද්විගුණ වේ. (----------)

xx. මයිකොප්ලාස්මාවල සත්‍ය සෛල බිත්ති නොමැත. (--------------)

02. පහත සඳහන් එක් එක් ඒවාට උදාහරණ එක (01) බැගින් දෙන්න. ඔබේ පිළිතුර <u>ගණ නාමයක්</u> විය යුතුය.

(i) අංකුරණය මගින් ප්‍රජනනය කරනු ලබන සයනොබැක්ටීරියාවකි.

---------------------------------------------------------------------------

(ii) පසේ ඇමෝනියා, නයිට්‍රයිට බවට පත් කරන බැක්ටීරියාවකි.

---------------------------------------------------------------------------

(iii) ආර්ථිකව වැදගත් ශාකවලට මුල්රෝග ඇති කරන වඩාත් හොඳින් දන්නා රාක්ක දිලීරයකි.

---------------------------------------------------------------------------

(iv) පරණ පාන් මත අළු පැහැති පුළුන් ගොඩක් මෙන් බොහෝවිට වැඩෙන දිලීරයකි.

---------------------------------------------------------------------------

(v) බීජ පැලවල මුල් තැම්බීමේ රෝගය (damping off) සාදන දිලීරයයි.

---------------------------------------------------------------------------

(vi) කෝෂ වැනි බීජාණුධානි තුල බීජාණු නිපදවන බැක්ටීරියාවකි.

---------------------------------------------------------------------------

(vii) ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන ගඳ හත්තකි. (stink – horn)

---------------------------------------------------------------------------------

(viii) රනිල කුලයේ ශාකවල මුල් සමඟ සහජීවී සංගම් සාදන බැක්ටීරියාවකි.

---------------------------------------------------------------------------------

(ix) පාදස්ථ හෙටරොසිස්ටයක් සහිත සූත්‍රිකාකාර සයනොබැක්ටීරියාවකි.

---------------------------------------------------------------------------------

(x) *Amaranthus* ශාකවලට සුදු මලකඩ රෝගය (white rust)සාදන පරපෝෂී දිලීරයකි.

---------------------------------------------------------------------------------

03. පහත සඳහන් ඒවා අතර මූලික වෙනස්කම් 03 බැගින් දෙන්න. රූප සටහන් අනවශ්‍යය.

(1) දිලීරවල දක්නට ලැබෙන අන්තඃදිලීරක සහ බහිර් දිලීරක මූල සංගම්,

| | අන්තඃදිලීරක මූල සංගම් | බහිර් දිලීරක මූල සංගම් |
|---|---|---|
| (i) | --------------------------- | --------------------------- |
| | --------------------------- | --------------------------- |
| (ii) | --------------------------- | --------------------------- |
| | --------------------------- | --------------------------- |
| (iii) | --------------------------- | --------------------------- |
| | --------------------------- | --------------------------- |

(2) *Aleurina* සහ *Eurotium* හි ලිංගික ප්‍රජනක ව්‍යුහ

| | *Aleurina* | *Eurotium* |
|---|---|---|
| (i) | --------------------------- | --------------------------- |
| | --------------------------- | --------------------------- |
| (ii) | --------------------------- | --------------------------- |
| | --------------------------- | --------------------------- |
| (iii) | --------------------------- | --------------------------- |
| | --------------------------- | --------------------------- |

(3) බැක්ටීරියාවන්ගේ ග්‍රෑම් ධන හා ග්‍රෑම් සෘණ සෛල බිත්ති

| | ග්‍රෑම් ධන සෛල බිත්ති | ග්‍රෑම් සෘණ සෛල බිත්ති |
|---|---|---|
| (i) | ---------------------------- | ---------------------------- |
| | ---------------------------- | ---------------------------- |
| (ii) | ---------------------------- | ---------------------------- |
| | ---------------------------- | ---------------------------- |
| (iii) | ---------------------------- | ---------------------------- |
| | ---------------------------- | ---------------------------- |

(4) *Agaricus* හි ප්‍රාථමික හා ද්විතියික දිලීර ජාලය

| | *Agaricus* හි ප්‍රාථමික දිලීර ජාලය | *Agaricus* හි ද්විතියික දිලීර ජාලය |
|---|---|---|
| (i) | ---------------------------- | ---------------------------- |
| | ---------------------------- | ---------------------------- |
| (ii) | ---------------------------- | ---------------------------- |
| | ---------------------------- | ---------------------------- |
| (iii) | ---------------------------- | ---------------------------- |
| | ---------------------------- | ---------------------------- |

\- හිමිකම් ඇවිරිණි. -